Department of Education, Sabaragamuwa Province/ Weekly School



# සරල වෙස් මුහුණු නිර්මාණය කරමු

නළුවකු තම මුහුණට උඩින් මුහුණ ආවරණය වන සේ පළඳින මුහුණ වෙස් මුහුණ නම් වේ. අතීතයේ ගැමි නාටක වලදී, ශාන්ති කර්ම වලදී තොවිල් ආදීයේ දී වෙස්මුහුණු භාවිත කර ඇත. සමාජයේ විවිධ චරිතවල නොමනා ගති ලක්ෂණ උපහාසයට ලක්කිරීම, විවිධ ලෙඩ රෝග සංකේතවත් කිරීම, ආදිය සඳහා වෙස් මුහුණු යොදාගෙන ඇත.






ලංකාවේ දකුණු මුහුදුබඩ ප්‍රදේශ වල වෙස් මුහුණු නිර්මාණයට ප්‍රචලිතය. වෙස්මුහුණු නිර්මාණය සඳහා විවිධ අමුද්‍රව්‍ය යොදාගත හැකිය. පහතරට ප්‍රදේශ දැව ආශ්‍රිත වෙස්මුහුණු වලට ප්‍රසිද්ධය.

මෙය අලංකාර වූත් නිර්මාණාත්මක වූත් අපූර්ව වූත් කලාංගයකි. යම් යම් ප්‍රදේශ වල පරම්පරාගතව මෙම කලා නිර්මාණ ප්‍රචලිතව ඇත.

නළුවකු ගේ මුහුණින් පෙන්වන සාත්වික අභිනය වෙස්මුහුණක් තුළට කාවද්දා පෙන්විය යුතුය. ඉන් ප්‍රේක්ෂකයාට චරිතය පිළිබඳ මනා අවබෝධයක් ලැබේ.

අප අවට ඇති ස්වාභාවික පරිසරයේ හා ඉවත දමන ද්‍රව්‍ය යොදාගෙන අපට වෙස් මුහුණක් නිර්මාණය කරගත හැකිය.

අවශ්‍ය ද්‍රව්‍ය

- ඉවත දමන කාඩ්බෝඩ්
- කඩදාසි
- වියළි කොළ
- ඉලස්ටික්
- ගම්
- කතුරක්
- පාට කොළ
- බැනර් පේන්ට්
- පින්සල්
- රෙදි කැබලි

සුදුසු පරිදි වෙස්මුහුණ නිර්මාණය කර ඇස්, කට, නාසය යනා දී ස්ථානයන් සිදුරු කරන්න. ඉලස්ටික් පටියක් ආධාරයෙන් රඳවාගන්න.





**පැවරුම : විවිධ චරිතයන්ට සුදුසු වෙස් මුහුණු නිර්මාණය කරන්න.**